**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 06 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය විය යුතු රු.1,163,313ක මුදල වෙනුවෙන් රු.3,000,000ක ණයහිමි ශේෂයක් ඇති කිරීම නිසා වර්ෂයේ වියදම් හා ණයහිමි ශේෂය රු.1,836,687ක් වැඩියෙන් දැක්වුණි.

(ආ). කඩා ඉවත් කර තිබුණු එකතුව රු.143,800ක් වූ ගොඩනැගිලි 03ක පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම නිසා එම ගිණුම් ශේෂයන් සමාන අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත වියදම රු.1,847,474ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඇ). මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු.93,592ක් වටිනා පරිගණක යන්ත්‍රයේ හා පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ටිපර් රථයේ හා රෝද 04 ට්‍රැක්ටරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ). සභා ගොඩනැගිල්ල හා සභා රැස්වීම් ශාලාව ඉදිකිරීම සඳහා දරා තිබුණු වියදම රු.568,905ක් අඩුවෙන්ද, සභා රැස්වීම් ශාලාව වැඩිදියුණු කිරීමේ කර්මාන්තයේ IIවන අදියර සඳහා දරා තිබුණු වියදම රු.118,276ක් වැඩියෙන්ද ගිණුම්වල දැක්වුණි.

(ඊ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු රු.138,392ක් වටිනා ගැල්වනයිස් බට 125ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්
-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.34,300,489ක් වූ ගිණුම් විෂයයන් 04කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.1,397,704ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 06ක එකතුව රු.1,909,888ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.203,056ක ශේෂ 03ක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 08ක එකතුව රු.26,448,375ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්ම වූ රු.1,349,154ක ශේෂ 03ක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.
--------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,655,246ක් වූ ගිණුම් විෂයයන් 04කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,310,597ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,981,960ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,328,637ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 අක්කර බදු
---------------

හිඟහිටි අක්කර බදු ශේෂය රු.107,473ක් වූ අතර, එම ශේෂය තුළ වසරකට වැඩි කාලයක් ඉක්ම වූ රු.101,233ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.2.2 වරිපනම් බදු
---------------

හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.159,051ක් වූ අතර, එම ශේෂය තුළ වසරකට වැඩි කාලයක් ඉක්ම වූ රු.119,547ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.2.3 කසළ ගාස්තු
------------------

හිඟ හිටි කසළ ගාස්තු ශේෂය රු.72,562ක් වූ අතර, එම ශේෂය තුළ වසරකට වැඩි කාලයක් ඉක්ම වූ රු.62,922ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
---------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.316,111ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.3,945,707ක මුදලක් අයවිය යුතුව තිබුණි.1992-2010 දක්වා කාලපරිච්ඡේදයට අදාලව ලැබිය යුතු රු.825,857ක මුද්දර ගාස්තු හා 2011 වර්ෂය සඳහා ලැබිය යුතු රු.29,100ක උසාවි දඩ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 පරිසර බලපත්‍ර
-------------------

පරිසර බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ව්‍යාපාර 13ක් සඳහා බලපත්‍ර නිකුත් නොකිරීමෙන් සභාවට රු.57,200ක ආදායම් අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

3.1 කාර්ය සාධන ඇගයීම
--------------------------

සභාවේ වැටුප් හා වේතන වියදම රු.14,779,482ක් වූ නමුත්, රු.10,024,976ක් පමණක් පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය වීම නිසා රු.4,754,506ක් සභා අරමුදලින් දැරීමට සිදු වී තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

දීර්සකාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.151,274ක කර්මාන්ත ණයගැති ශේෂය නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ලැබී තිබුණු අයදුම්පත් 162කින් අයදුම්පත් 116ක් අනුමත කර තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 02ක් සඳහා පමණි.

(ආ). වෙළඳ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, බලපත්‍ර ලේඛනයේ සඳහන් ව්‍යාපාර සංඛ්‍යාව සඳහා පමණක් අයදුම්පත්‍ර නිකුත් කර තිබුණි.

(ඇ) 1987 වර්ෂයෙන් පසු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු
----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතු අම්බොක්ක ජල යෝජනා ක්‍රමයේ පාරිභෝජනය කල ඒකක ගණනට අනුකූල වන පරිදි ජල ගාස්තු අයකිරීමට වැඩ පිළිවෙලක් සකස් නොකර රු.200ක ස්ථාවර මාසික ගාස්තුවක් අයකර තිබුණි.

(ආ). සභා කාර්යාලය පිහිටි භූමියේ අයිතිය නීත්‍යානුකූලව පවරා නොගැනීම හේතුවෙන්, පවරා තිබූ නඩුව සඳහා 2001 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ නඩු ගාස්තු වෙනුවෙන් රු.117,500ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.5 අවිධිමත් ගනුදෙනු

-------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(i)(i) වගන්තියේ විධිවිධාන පරිදි විධිමත් අනුමැතියක් ලබා නොගෙන සේවකයින් 24 දෙනෙකු සේවයේ යොදවා සමාලෝචිත වර්ෂයේදී රු.3,128,326ක වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.6 හඳුනාගත් අලාභ

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය තුල රු.58,500ක වියදමින් මිලදීගෙන තිබුණු ඇඹිලි සළකුණු යන්ත්‍රය අක්‍රීය වී තිබුණු නමුත් එය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකර භාවිතයෙන් ඉවත්කර තිබුණි.

(ආ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලබා දී තිබුණු ගැල්වනයිස් බටවලින් රු.56,464ක් වටිනා බට ඒකක 51ක ඌනතාවයක් විය.

(ඇ). සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක ජල යෝජනා ක්‍රමයකින් රු.72,255ක පාඩුවක් සිදු වී තිබුණි.

3.7 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පිරිවැය රු.884,400ක් වූ වාහන 02ක් වසර 05ක පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණු අතර, පිරිවැය රු.14,300ක් වූ ප්‍රජා ශාලා ගොඩනැගිල්ලක් හා රු.65,000ක් වූ ජල ගබඩා ටැංකියක් පරිහරණයට නොගැනීම නිසා අභාවිතව පැවතුණි.

3.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

විධිමත් කසළ බැහැර කිරීමේ ක්‍රමයක් සභාව සතුව නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා නීත්‍යානුකූලව ඉඩමක් පවරාගෙන නොතිබුණි. දෛනිකව එකතු කරනු ලබන කසළ, මොරගස්පිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩමක වළවල් කපා බැහැර කර, ඒවා පස්වලින් වසා දැමීමට කටයුතු කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

1988 (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/ඩීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමණාකරණ කමිටු පිහිටුවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, එකී කමිටු පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

4.3 අයවැය පාලනය

(අ). ආදායම් විෂයයන් 11ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 13 සිට සියයට 67 අතර පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). වැය විෂයයන් 14ක් සඳහා සලසාදී තිබූ රු.490,000ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු අතර, තවත් වැය විෂයයන් 25ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 2 සිට සියයට 67 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය

(ඈ). කොන්ත්‍රාත් පාලනය

(ඉ). ණයගැති සහ ණයහිමි පාලනය

(ඊ). වාහන පාලනය

(උ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය